# පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

## මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් ඒකකය සඳහා

# පුරප්පාඩු

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පිහිටුවා ඇති ඉදිකිරීම් ඒකකයේ පහත දැක්වෙන තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

## ඉංජිනේරු (සිවිල්) - තනතුරු 01

- **බඳවා ගන්නා ශ්‍රේණිය :** (කොන්ත්‍රාත් පදනම)
- **වැටුප :** සාකච්ඡා කර එකඟ විය හැක.
- මූලිකව වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවා ගන්නා අතර, අවශ්‍යතාවය අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ හැක.
- **සුදුසුකම් :**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

  සහ

  උපාධිය ලබා ගැනීමෙන් පසු ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් සහිත වීම, එයින් වසර 10 ක ගොඩනැගිලි ඉදිකිරීම් සහිත සේවා පළපුරුද්දක් තිබීම.

## කාර්මික නිලධාරී (සිවිල්) - තනතුරු 01

- **බඳවා ගන්නා ශ්‍රේණිය :** (කොන්ත්‍රාත් පදනම)
- **වැටුප :** රු. 46,000/-
- මූලික වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවා ගන්නා අතර, අවශ්‍යතාවය අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ හැක.
- **සුදුසුකම් :**

  තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන NDT (සිවිල්) / NCT (සිවිල් - පූර්ණකාලීන) ප්‍රවීණතා මට්ටමක් ලබා තිබීම

  සමග

  ප්‍රමාණ පත්‍ර සකස් කිරීම, ව්‍යුහ සැලසුම් පිළිබඳ අවබෝධය, මිනුම් මට්ටම් ගැනීම ඇතුළුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් සහිත වීම.

## පොදු කොන්දේසි :

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

IV. රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරනු ලබන්නේනම් ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.

V. මධ්‍යම පළාතේ පදිංචි අයදුම්කරුවන් විසින් පමණක් අයදුම්පත් යොමු කළ යුතුය.

VI. ඉදිකිරීම් ඒකකය යටතේ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන් සඳහා ඔබ බඳවා ගනු ලබන අතර, එම ව්‍යාපෘතීන් අවසන් වූ විට ඔබගේ කොන්ත්‍රාත් සේවා කාලයද අවසන්වනු ඇත.

**බඳවා ගන්නා ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

ඉහත සුදුසුකම් ඇතුළත් කර අයදුම්කරුවන් විසින් සකස් කර ගන්නා ජීව දත්ත විස්තර ලේඛනයක් 2021.02.22 වැනි දිනට පෙර සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 09, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුයි.

**සාමාන්‍යාධිකාරී / ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**මධ්‍යම පළාත.**

**දුරකථන අංකය : 081-2204378**

Source: Dinamina, Daily News (2021.02.08)